පිළිතුරු සපයන්න

නිපුණතා මට්ටම - 5:8:1 ජීවීන්ගේ ප්‍රජනන රටා විමසා බලයි.

ඇගයීම

1) ප්‍රජනනය යනු කුමක්දැයි අර්ථ දක්වන්න
2) බොහෝ සතුන්ගේ ප්‍රධාන සහ එකම ප්‍රජනන අකාරය කුමක්ද ?
3) අලිංගික ප්‍රජනනය යනු කුමක්දැයි අර්ථ දක්වන්න
4) අලිංගික ප්‍රජනනයේ වාසි නම් කරන්න
5) අලිංගික ප්‍රජනනයේ අවාසි තුනක් නම් කරන්න
6) අපෘෂ්ටවංශීන් අතර සුලබව දැකගත හැකි අලිංගික ප්‍රජනන ආකාර නම් කරන්න
7) උදාහරණ දක්වමින් සතුන් අතර දැකිය හැකි අලිංගික ප්‍රජනන ආකාර කෙටියෙන් පැහැදිලි කරන්න
8) කෞමාරෝද්භවය නම් විශේෂිත ප්‍රජනන ක්‍රමය දැකගත හැකි අපෘෂ්ටවංශී සත්ව කාණ්ඩ කිහිපයක් නම් කරන්න
9) අපෘෂ්ටවංශීන් අතර කෞමාරෝද්භවය දැකිය හැකි සත්ව කාණ්ඩ දෙකක් නම් කරන්න
10) ලිංගික ප්‍රජනනය යනු කුමදැයි අර්ථ දක්වන්න
11) ලිංගික ප්‍රජනනයේ වාසි නම් කරන්න
12) ලිංගික ප්‍රජනනයේ අවාසි නම් කරන්න
13) ජන්මාණු යනු මොනවාද ?
14) ද්විලිංගික සහ ඒක ලිංගික ජීවීන් අතර වෙනස පැහැදිලි කරන්න
15) සංසේචනය යනු කුමක්ද?
16) බාහිර සංසේචනයේ ප්‍රධාන අවශ්‍යතාවය කුමක්ද?
17) බාහිර සංසේචනය පෙන්වන ජීවීන්ට උදාහරණ දෙන්න
18) අභ්‍යන්තර සංසේචනයේ වැදගත්කම කුමක්ද ?
19) අභ්‍යන්තර සංසේචනය පෙන්වන ජීවීන්ට උදාහරණ දෙන්න
20) අභ්‍යන්තර සංසේචනය බාහිර සංසේචනයට වඩා වෙනස් වන්නේ කෙසේද?
21) අභ්‍යන්තර සංසේචනය පෙන්වන සමහර ජීවීන් පෙන්වන වැදගත් ලක්ෂණ කිහිපයක් නම් කරන්න

රචනා

22)

a) ජීවීන් අතර දැකිය හැකි අලිංගික ප්‍රජනන ක්‍රම විස්තර කරන්න
b) අලිංගික ප්‍රජනනය සහ ලිංගික ප්‍රජනනයේ වැදගත්කම පැහැදිලි කරන්න

වැඩි දුර කියවීම - ජීව විද්‍යාව සත්ව ආකාරය සහ ක්‍රියාකාරිත්වය **II** සම්පත් පොතේ පිටු අංක **47.48.49**

සැකසුම - අනුජා උදය කුමාරි , ර/ කුරුවිට මධ්‍ය මහා විද්‍යාලය, කුරුවිට